# 10 මුල් කිතුනු සභාවෙන් ආදර්ශයක්

**මුල් කිතුනු සභාවේ ආරම්භය, මෙහෙවර හා ආදර්ශය පිළිබඳව විමසා බලමින් කිතුනු ජීවිතයේ වර්ධනය සඳහා ඉන් ලැබෙන මග පෙන්වීම් යොදාගත හැකි අයුරු අධ්‍යයනය කිරීම මෙම පාඩමින් අපේක්ෂිත ය.**

ක්‍රියා 2: 1-3, 2: 37-47, 4: 32-37, 5: 12-16, 6: 1-7

'සභාව' යන්න පිරිසක් රැස්වන ස්ථානයක් හැඳින්වීම සඳහා ව්‍යවහාර කෙරේ. කුඩා පිරිසක් හෝ විශාල පිරිසක් එක් රැස්වන කළ ඔවුන් සභාවක් ලෙස හැඳින්වේ.

කිතුනු සභාව කිතුනුවන්ට ම ආවේණික වූවකි. ක්‍රිස්තුන් වහන්සේ අදහමින් උන්වහන්සේ ලොවට ප්‍රකාශ කරමින් එකතුවන සැමදෙනා තුළින් කිතුනු සභාව ගොඩනැගී තිබේ.

කිතුනු සභාව තුළ විවිධ නිකාය පැවතිය ද සැවොම එක ම ස්වාමින් වහන්සේ තුළ පෝෂණය ලබති.

දෙවියන් වහන්සේ විසින් නියම කරන ලද මතු දිනයක දී දේව රාජ්‍යය පරිපූර්ණත්වයට පත්වේ. ඒ දවස උදාවන තුරු නව දේව ජනතාව වශයෙන් පෙනී සිටිනුයේ ශුද්ධ සභාව යි.

## මුල් කිතුනු සභාවේ ආරම්භය

අවස්ථාව: ජේසුස් වහන්සේගේ උත්ථානයෙන් (කිතුනු පාස්කුවෙන්) දින පනහකට පසුව පැවති පෙන්තකොස්ත මංගල්‍යය ජුදෙව් කෘෂිකාර්මික මංගල්‍යයකි.

විශේෂත්වය → ජුදෙව්වරුන් සිය අස්වැන්නේ ප්‍රථම ඵල පිදීමට ජෙරුසලමට පැමිණීම

රැස්වූ ස්ථානය → ජෙරුසලමේ උඩුමහල - යාච්ඤාවෙන් එකතු වූ ශ්‍රාවකයන් ඇතුළු සැම

විශේෂ සිදුවීම → ශුද්ධාත්ම දානය

විශේෂ ලක්ෂණ →
- සැඩ සුළඟක් හමන්නාක් වැනි හඬක් අහසින් නික්මීම (ශුද්ධාත්ම බලය ප්‍රකාශ වීම)
- ගිනි දලු වැනි දිව් බෙදී ගොස් එකිනෙකා මත පිහිටීම (ශුද්ධාත්ම බලය දැනීම)
- සැවොම ශුද්ධාත්ම බලයෙන් පූර්ණව අන්‍ය භාෂාවලින් කතා කිරීම (ශුද්ධාත්ම බලය තුළ ජ්වලිතකම)

ප්‍රතිඵල → පෙන්තකොස්ත දින 3000ක් පමණ සෙනග බව්තීස්මය ලබා සභාවට එකතු වීම.

මුල් කිතුනු සභාවේ ආරම්භය අධ්‍යයනය කළ අපට, ජීවිතයේ ප්‍රමුඛ ස්ථානය දෙවියන්වහන්සේට පිදීමටත්, යාච්ඤාවෙන් එකමුතු ව කල් ගත කිරීමටත් එමගින් දිරියක් ලැබේ. තව ද දේව පොරොන්දුව ඉටුවන තෙක් විශ්වාසයෙන් හා අපේක්ෂාවෙන් කල් යැවීමටත්, දෙවිඳුන්ගේ වැඩ සිටීමට ජීවිතය තුළ අවකාශ සැලසීමටත් මග පෙන්වීමක් ලබා දෙයි.

එමෙන් ම ශුද්ධාත්ම බලයෙන් පූර්ණ ව නව ජීවනයක් අත්දැකීමට නිතැතින් අප යොමු කෙරේ.




## 1. නමස්කාරික ජීවිතයේ නියැලීම

පෙන්තකොස්ත අත්දැකීමෙන් ශුද්ධාත්මයාණන් වහන්සේ තුළ නව ජීවයක් ලද කිතුනුවෝ සිය අධ්‍යාත්මික ජීවිතය වර්ධනය කර ගැනීමට එම නව අත්දැකීම ඉවහල් කර ගත්හ. ඔවුහු,

- දිනපතා නොකඩවා එක්සිත් ව දේව මාලිගාවේ රැස්වීමෙන්,
- ගෙයින් ගෙට ගොස් රොටි කැඩීමෙන්,
- සහභාගිකම පැවැත්වීමෙන්,
- යාච්ඤාවේ නිරත ව කල්ගත කිරීමෙන්,
- ප්‍රේරිතවරුන්ගේ ඉගැන්වීමෙහි පැවතීමෙන්,
- දෙවියන් වහන්සේට ප්‍රශංසා කිරීමෙන්,
- දේව භයෙන් හා ගෞරවයෙන් කල් ගත කළහ.



## 2. ධර්මදූත සේවයේ යෙදීම

ශුද්ධාත්ම ආගමනය සිදු වූ පෙන්තකොස්ත දින ප්‍රථම දේශනය ඉදිරිපත් කළ පේදුරුතුමා මුල් සභාවේ ධර්මදූත මෙහෙවර දියත් කළ ප්‍රථමයා වේ.

සියල්ලෝ ම පසුතැවී සිත් හරවාගෙන පව් කමාව ලබන පිණිස ජේසුස් ක්‍රිස්තුන් වහන්සේගේ නාමයෙන් බව්තීස්ම ස්නාපනය ලැබිය යුතු බවත් එවිට ඔවුන් ශුද්ධාත්ම දීමනාව ලබන බවත් ඔහු අවධාරණය කළේ ය. පේදුරුතුමා ඇතුළු අන් ශ්‍රාවකයන් සැම දෙනා මුල් කිතුනු සභාවේ ධර්මදූත මෙහෙය ඉදිරියට ගෙන යමින් එය මනාව පෝෂණය කළ ආකාරය දැක ගත හැකි වේ. ඒ තුළින් ගැලවීම ලබන්නන් වූ ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයෙන් සමන්විත ඇදහිලිවන්ත සභාව දිනෙන් දින වර්ධනය වූ බවට ක්‍රියා පොත සාක්ෂි දරයි.

මෙසේ වර්ධනය වෙමින් සභාව ගමන් කළ මග දෙස බලන කළ පහත සඳහන් අංශ දෙක තුළින් සභාව සිය සාක්ෂිය ලොවට ප්‍රකාශ කළ බව මනාව පැහැදිලි වේ.

(අ) ධර්මදාන මෙහෙවර (ආ) සුබ සාධන මෙහෙවර

### (අ) ධර්මදාන මෙහෙවර ඉටු කිරීම

ධර්මදාන මෙහෙවර ඉටු කිරීම සම්බන්ධයෙන් ක්‍රියා පොත පහත කරුණු සඳහන් කරයි.

- දේශනා කිරීම තුළින් සුභාරංචි සේවය ව්‍යාප්ත කිරීම.
- ජේසුස් ක්‍රිස්තුන් වහන්සේගේ නාමයෙන් බව්තීස්ම ස්නාපනය කිරීම තුළින් පසුතැවිලි වීමේ ජීවිත ගත කිරීමට දිරිමත් කිරීම.
- බොහෝ අරුම පුදුම හා ලකුණු තුළින් ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ කෙරෙහි විශ්වාස කරමින් ඇදහිල්ල වර්ධනය කරගැනීම.
- ස්වාමින් වන ජේසුස් ක්‍රිස්තුන් වහන්සේගේ පුනරුජ්ජීවනය පිළිබඳව ප්‍රබල ලෙස සාක්ෂි දැරීම.
- රෝගාතුර වූවන් හා දුෂ්ටාත්මයන්ගෙන් පීඩිත වූවන් සුව කිරීම තුළින් ජනතාවට සුව සහනය සැලසීම.

### (ආ) සුබ සාධන මෙහෙවර

ශුද්ධාත්ම දානයෙන් නව ජීවනයක් අත්දුටු මුල් ඇදහිලිවතුන් සිය ජීවන රටාව හා ආකල්ප ක්‍රිස්තු කේන්ද්‍රීය ක්‍රමයට හැඩගස්වා ගත් ආකාරය අපට පැහැදිලි වේ. තමා සතු දේපළ හා වස්තුව සම්බන්ධයෙන් නව ක්‍රමයක් අනුගමනය කරමින් ඔවුහු, සුබසාධන සේවයට, නව අරුතක් එක් කළහ.

***ඇදහිලිවතුන් සියල්ලෝ එක් වී හැම දෙය ම පොදුවේ තබා ගත්හ.***<br>***ඔවුන් තමන්ගේ ඉඩකඩම් හා දේපළ විකුණා***<br>***එකිනෙකාගේ වුවමනාවේ හැටියට සියලු දෙනා අතර බෙදා ගත්හ.***<br>***ක්‍රියා 2: 44-45***

**මින් මතු වන වැදගත් වටිනාකම් පහත දැක්වෙන සේ ඉදිරිපත් කළ හැකි ය.**

- ❊ සුබසාධන සේවයට අනුබල ගෙන දෙන පොදු ප්‍රතිපත්තියක් හා බෙදා ගැනීමේ ප්‍රතිපත්තියක් මුල් සභාව තුළින් ක්‍රියාත්මක වීම.
- ❊ කිතුනු සමාජයට සමානාත්මතාව හා සහජීවනය යන වැදගත් වටිනාකම් එක්වීම.
- ❊ ඇදහිලිවන්ත සමූහයා එක්සත් ව, එක්සිත් ව විසීම.
- ❊ තමන් සතු දෙයින් කිසිවක් තමාගේ ම යැයි නො පැවසීම.
- ❊ තම තමන් අතර ප්‍රීතියෙනුත්, ත්‍යාගවන්ත සිතිනුත් ආහාර වැනි දෑ බෙදාගැනීම.
- ❊ සියල්ල පොදුවේ තබාගැනීම.
- ❊ තමා සතු වතුපිටි/නිවාස වැනි දේ විකුණා මුදල් ප්‍රේරිතයන්ට භාරදීම. බාර්ණබස් නම් ලත් ජෝසප්ගේ ආදර්ශය. (ක්‍රියා 4: 31-37)
- ❊ ප්‍රේරිතයන් එම මුදල් නිසි ලෙස කළමනාකරණය කරමින් එකිනෙකාගේ වුවමනාවේ ප්‍රකාරයට බෙදා දී අවශ්‍යතා පිරිමැසීම.

මුල් සභාවේ මෙම නව සුබ සාධන මෙහෙවර ඉදිරියට ගෙන යාමේ දී ඉස්මතු වූ ගැටලු සහගත තත්ත්වයක් ද දැකිය හැකි විය.

| | |
|---|---|
| ගැටලුව: | දිනපතා සහනාධාර දීමේ දී ග්‍රීක් වැන්දඹුවන් නොසලකා හැරීම පිළිබඳව ඉදිරිපත් වූ පැමිණිල්ල. |
| එහි දී ගත් පියවර: | අපෝස්තුළුවරුන් විසින් අනෙකුත් ගෝල සමූහයා සමග සාකච්ඡා කිරීම |
| සාකච්ඡාව: | අපෝස්තුළුවරුන් විසින් දෙව් දහම දේශනා කිරීම අතපසු කොට සහනාධාර බෙදීමේ කටයුතුවල නිරත වීමේ තත්ත්වය මග හරවා ගත හැකි අයුරු. |
| අවසාන විසඳුම: | සහනාධාර දීමේ කටයුත්ත නිසි පරිදි ඉටුකිරීම සඳහා උපස්ථායක කණ්ඩායමක් පත් කිරීම. |
| එම තනතුරට පත්වන්නන් සඳහා සුදුසුකම්: | යහපත් යැයි පිළිගත්, ශුද්ධාත්මයෙන් හා ප්‍රඥාවෙන් පූර්ණ වීම. |
| සහනාධාර සේවයට තෝරාගත් උපස්ථායක කණ්ඩායම: | ස්තේපන්, පිලිප්, ප්‍රොකොරස්, නිකනොර්, තීමොන්, පර්මේනස් හා නිකොලොස් |
| පත්කිරීමේ ක්‍රියා පිළිවෙළ: | හත් දෙනකුගෙන් යුත් කණ්ඩායම ප්‍රේරිතයන් වෙත ඉදිරිපත් කිරීම<br>ප්‍රේරිතයන් එම කණ්ඩායම වෙනුවෙන් යාච්ඤා කිරීම.<br>ඔවුන් මත අත් තැබීම |

සුබසාධන සේවයේ ගැටලුවලට මුහුණ දී එම අභියෝග ජයගත් මුල් සභාවේ ගැටලු නිරාකරණය කිරීමේ ක්‍රියාදාමය තුළින් මතු වූ වටිනාකම් මෙලෙස දකිමු.

- ගැටලු ඇතිවීමේ දී ඒ සඳහා විසඳුම් සෙවීමට ක්ෂණික ව ක්‍රියාත්මක වීම.
- සමානාත්මතාව උසස් කොට සැලකීම.
- ශුද්ධාත්ම බලය තුළ නිවැරදි තීරණ ගැනීම.
- සාකච්ඡාවෙන් විසඳුම් සෙවීම.
- දේව වචනය දේශනා කිරීමට මූලිකත්වය දීම.
- යාච්ඤාවෙන් දේව මග පෙන්වීම ලබා ගැනීම.
- දෙවියන් වහන්සේ ලබා දී ඇති විවිධ හැකියාවන් සභාවේ අභිවෘද්ධිය සඳහා යෙදවීම.

ශුද්ධාත්මයාණන් වහන්සේ තුළින් දිරිය හා සවිය ලබා සියල්ලන්ගේ ප්‍රසාදයට පත්වෙමින් දිනපතා වර්ධනය වූ මුල් කිතුනු සභාව වත්මන් කිතුනු සභාවට හා කිතුනු සැම දෙනාට ම ගෙන දෙන්නේ ප්‍රබල අභියෝගයකි. එමෙන් ම ආදර්ශයකි. සභාවේ නමස්කාරික ජීවිතය, ධර්මදූත සේවය තුළ ධර්ම දානය හා සුබ සාධනය සවිමත් කර ගැනීම සඳහා වූ මුල් කිතුනු සභාවේ වටිනාකම් යොදා ගැනීම අත්‍යවශ්‍ය වන බව පැහැදිලි ය. එසේ ම පෞද්ගලිකව කිතුනු ජීවිත සවිමත් කර ගැනීම සඳහා ඉන් ලැබෙනුයේ මහඟු ආදර්ශයකි.

**ක්‍රියාකාරකම්**

1. මුල් කිතුනු සභාවේ වටිනාකම් අතුරෙන් ඔබ වඩාත් අගය කරන වටිනාකම් 5 ක් ලියා දක්වන්න.

2. 'මුල් කිතුනු සභාවේ නව සුබ සාධන ක්‍රමය වත්මන් කිතුනු සභාවට ආදර්ශයකි' නිදසුන් මගින් පහදන්න.

3. වත්මන් ශ්‍රී ලංකාව තුළ ධර්මදාන මෙහෙවර හා සුබසාධන මෙහෙවර ඉටු කිරීමේ දී මුහුණ පෑමට සිදුවන අභියෝග හා ඒවා ජයගත හැකි අයුරු පැහැදිලි කරන්න.